2020 වර්ෂයේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 2020/ 2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරුවන් අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් යොමු කර ලබාගන්නා මුද්‍රිත අයදුම්පත තම අත්සන යොදා (මුද්‍රිත අයදුම්පතෙහි අංක 5 යටතේ ඇති "Order of Course & University Preference" සහ අංක 6 යටතේ ඇති "Applicant's Declaration" යන පිටු දෙකම), සම්පූර්ණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් හෝ පැහැදිලි ඡායාරූපයක් apply2020@ugc.ac.lk යන විද්‍යුත් ලිපිනය ඔස්සේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීම අනිවාර්යය අවශ්‍යතාවයක් වේ.

තවද දැනට රට තුළ උද්ගත වී ඇති කොවිඩ්-19 අධි වසංගත තත්ත්වය හමුවේ අයදුම්කරුවන් විසින් තම අත්සන යෙදු සම්පූර්ණ අයදුම්පත ලියාපදිංචි තැපැල ඔස්සේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට පෙර ප්‍රවේශ අත්පොතෙහි සඳහන් අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට නොහැකි වන අයදුම්කරුවන් විසින් පහත සඳහන් අයුරින් කටයුතු කල යුතුය.

<u>**පාසැල් අයදුම්කරුවන් සඳහා**</u>

- අදාළ අයදුම්කරු පාසැල් අයදුම්කරුවෙකු නම් මෙවර තම අත්සන පමණක් යෙදූ මුද්‍රිත සම්පූර්ණ අයදුම්පත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනට බලපැවැත්වෙන අදාළ සංචරණ සීමා ඉවත්කළ වහාම ලියාපදිංචි තැපැල ඔස්සේ යොමු කිරීම අනිවාර්යය වේ.

<u>**පෞද්ගලික අයදුම්කරුවන් සඳහා**</u>

- අදාළ අයදුම්කරු පෞද්ගලික අයදුම්කරුවෙකු නම් තම අත්සන යෙදූ මුද්‍රිත සම්පූර්ණ අයදුම්පත, ප්‍රවේශ අත්පොතෙහි සඳහන් වන පරිදි පාසැල හැර යාමේ සහතිකය සහ තම පදිංචිය තහවුරු කිරීම සඳහා වන ග්‍රාම සේවා සහතිකය (DS4 සහතිකය) දැනටමත් අයදුම්කරුවන් ළඟ පවතී නම් ඒවායෙහි ද ස්කෑන් පිටපත් හෝ පැහැදිලි ඡායාරූප අයදුම්පත සමඟ ඉහත විද්‍යුත් තැපෑලට යොමු කළ යුතුය.
- එම ලියවිලි දැනට තමන් සතුව නොමැති අයදුම්කරුවන් තම අත්සන පමණක් නිවැරදිව යෙදූ සම්පූර්ණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් හෝ පැහැදිලි ඡායාරූපයක් ඉහත විද්‍යුත් ලිපිනයට යොමු කිරීම දැනට ප්‍රමාණවත් වේ.
- මීට අමතරව පාසැල හැර යාමේ සහතිකයේ සහ තම පදිංචිය තහවුරු කිරීම සඳහා වන ග්‍රාම සේවා සහතිකයේ (DS4 සහතිකයේ) මුල් පිටපත් සමඟ අත්සන යෙදූ මුද්‍රිත සම්පූර්ණ අයදුම්පත දැනට බලපැවැත්වෙන අදාළ සංචරණ සීමා ඉවත්කළ වහාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලියාපදිංචි තැපැල ඔස්සේ යොමු කිරීම අනිවාර්යය වේ.

ඉහත සඳහන් කර ඇති පරිදි අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලියාපදිංචි තැපැල ඔස්සේ යොමු කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසියම් විශ්වවිද්‍යාලයක් සඳහා තේරී පත් වුවද එකී අවශ්‍යතා සම්පූර්ණ කරන තුරු එලෙස තේරී පත් වූ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචි වීමට ඔවුන්ට අවස්ථාව හිමි නොවනු ඇත.